# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 157/10 — 1975 අප්‍රේල් 02 වැනි බදාදා — 1975.04.02

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරිකිරීම් පිළිබඳ පනත**

**47 (1) වන වගන්තිය යටතේ නිවේදනය**

1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරිකිරීම් පිළිබඳ පනතේ 47 (I) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදලට දායක මුදල් ගෙවීමට එකී පනත යටතේ නියම කරනු ලැබූ යම් තැනැත්තකු —

(අ) 1974 අප්‍රේල් 01 වන දින හෝ ඉන්පසු ඇරඹෙන යම් තක්සේරු වර්ෂයක් සඳහා තමා —

(i) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා අනුමත කර නොමැති යම් අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලකට දායක මුදල් ගෙවා තිබේ යයි හෝ

(ii) තම සේවායෝජකයා විසින් සපයන ලද වාහන පහසුකම්වල වටිනාකම සේවායෝජකයාට ආපසු ගෙවීමක් වශයෙන් යම් මුදලක් ගෙවා තිබේයයි හෝ,

(ආ) 1974 අප්‍රේල් 01 වන දින හෝ ඉන්පසු ඇරඹෙන යම් තක්සේරු වර්ෂයක් සඳහා තමාගේ ලාභවලට හා ආදායමට —

(i) සේවායෝජකයා විසින් නොමිලේ සපයනු ලබන යම් නිවසක කුලී වටිනාකම හෝ

(ii) සේවායෝජකයා විසින් නොමිලේ සපයනු ලබන යම් වාහන පහසුකම්වල වටිනාකම

ඇතුළත්වේ යයි

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටින්නේ නම් එකී තැනැත්තාට සහනය දීමට කොමසාරිස් ජනරාල්ට බලය තිබෙන බව මෙම නිවේදනය මගින් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1975 මාර්තු මස 31 වන දින,
කොළඹ දී ය.

4-228/1

1 A—ඊ 13562—4,400 (75/04)

එල්. ඩී.—බී. 25/72

**1972 අංක 15 දරන ආදායම් උපරිමය සහ අනිවාර්ය ඉතිරිකිරීම් පිළිබඳ පනත**

1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරිකිරීම් පිළිබඳ පනතේ 9 (6) (ආ) වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් අමාත්‍යවරයා විසින් කරන ලද නියමයයි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1975 මාර්තු මස 31 වන දින,
කොළඹ දී ය.

නියමය

1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරිකිරීම් පිළිබඳ පනතේ 9 (6) (ආ) වන වගන්තිය යටතේ කරනු ලැබ 1972 දෙසැම්බර් 29 වන දින අංක 39/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද නියමයෙන් අවසන් වරට සංශෝධිත නියමය, එහි උපලේඛනයේ 6 වන ඡේදයට වූ පළමුවන අතුරු විධානය ඉවත් කිරීමෙන් එම උපලේඛනයේ 6 වන ඡේදයෙහිලා මෙසින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

4-228/2

---

ඇල්. ඩී.—බී. 1/75

**ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

57 වන වගන්තිය යටතේ නියමය

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 57 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍ය මෛත්‍රීපාල සේනානායක වන මම, ජල සම්පාදන සහ ජලාපවහන දෙපාර්තමේන්තුව විසින් හෝ ඒ දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඇතුළත්ව ඇත්තාවූ හෝ ඒ දෙපාර්තමේන්තුව පාර්ශවයක්ව 1975 ජනවාරි මස පළමුවන දිනට වලංගුව පැවතියා වූ සියලු කොන්ත්‍රාත්තුවලින්, ගිවිසුම්වලින් හා අනෙකුත් සාධන පත්‍රවලින් උද්ගත වන ඒ දෙපාර්තමේන්තුවේ කර්මාන්තයට අදාළ හෝ සම්බන්ධ අයිතිවාසිකම්, බැඳීම් සහ වගකීම් සියල්ලම එකී පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මේ නියමය මගින් පවරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍ය.

1975 අප්‍රේල් මස 1 වන දින,
කොළඹ දී ය.

4-227

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී